


පෙනුමෙන් දැනුමෙන් සවියෙන් කතා බහෙන් හා ක්‍රියාවෙන් කැපී පෙනෙන පුද්ගලයන්ට ගරු සරු දැක්වීම එදාත් අදත් සමාජයේ දක්නට ලැබෙන්නකි.



# මිනිස්කමට ලන්සුවක්

නායකයන් බවට පත් වී සෙස්සන්ට මග පෙන්වන්නේත් ඔවුන් තමන්ට රිසි පරිදි හසුරුවා ලන්නේත් ඒ වාගේ විශේෂතා සහිත පුද්ගලයන් ය.

සදාතන ධර්මතාවක් ලෙසින් ගත යුතු මේ යථාර්ථය සැබැවින්ම අදටත් වලංගු වන්නක්ද යන ප්‍රශ්නය මතු කරන්නට සිදුවන්නේ මෑතක උතුරු කොරියාවේ සිදු වූ පරිවර්තනය දෙස බලන විට ය.

සෙසු ලෝකයාට තබා තම රටේ ජනතාවට පවා ආගන්තුකයකු ව සිටි ළපටි තරුණයෙක් හිටි හැටියේ දේශයේ අති ප්‍රබල ජන නායකයා බවට පත් වූයේ ය. සේනාධිනායක තනතුර ද හිමිකර ගත්තේ ය. එසේ වූයේ එකම එක සාධකයක් හේතු කොට ගෙන ය. එනම් මිය ගිය නායකයාගේ පුතකු වීම ය. ඒ නායකයා විසින් වරම් දෙනු ලැබීම ය.

පියාගෙන් පුතාට නැතහොත් අය්යාගෙන් මල්ලීට ඔටුන්න හිමිවන රජ පරපුරක වාගේ පාලන බලය අතින් අත යාමක් ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක පමණක් නොව කොමියුනිස්ට් පාලන තන්ත්‍රයට පවා ආගන්තුකව පැවතියකි. එය වෙනස් කරන ලද්දේ මෑතක මිය ගිය උතුරු කොරියා නායකයාගේ පියා වූ කිම් ඉල් සුන් විසින් ය. ඔහු ජාතියේ සදාකාලික නායකයාගේ තැනට පත් වූවා පමණක් නොව ඒ බලය තමන්ට රිසි පරිදි පුත්‍රයාට පවරා දීමේ බලය හා ශක්තියද ලබා ගත්තේ ය. නොබෝදා සිදු වූයේ එසේ අබිසෙස් ලද පුත්‍රයා විසින් තමාගේ පුත්‍රයකු අබිසෙස් කිරීම පමණි.

මේ සුවිශේෂ චාරිත්‍රය තවත් ලරම්ලරා කීයක් ඉදිරියට පවත්වා ගෙන යනු ඇද්ද යන්න ඉතිහාසය විසින් විසඳනු ලබනු ඇත .

බැලූ බැල්මට නම් නායකත්වයට පත් වීමට සුදුසුකම් වශයෙන් මුලින් සඳහන් කළ එක ද ලක්ෂණයක් වත්මන් උතුරු කොරියා නායකයාට තිබෙන පාටක් නැත . එසේ නම් එබඳු අධිගමයක් ලැබීමට ඔහු සමත් වූයේ කෙසේ ද? හරියටම කියතොත් එබඳු පිළිගැනීමක් ඔහුට ආරූඪ කිරීමට බලධාරීන් සමත් වූයේ කෙසේ ද?

කොයි ආකාරයෙන් හෝ පුදුමාකාර ජනතා ප්‍රසාදයක් හා අනුකූලතාවක් ජනිත කරන්නට අභාවප්‍රාප්ත නායකයා සමත් වූ බව ඔහුගේ අභාවය පිළිබඳ ව ප්‍රදර්ශනය කරන ලද ශෝකාලාප දර්ශනවලින් පැහැදිලි වන්නේ ය. අපට පෙන්වන ලද්දේ මුළු මහත් ජාතියම එකාවන් ව හඬා වැළපෙන දර්ශන ය. සිය නායකයා වෙනුවෙන් දිවි පවා පුද කරන්නනට සැදී පැහැදී ගත් ජනතාවකගේ දුක් සුසුම් ය. මෙය හුදෙක් ලෝකෙට පරකාසයක් පමණක් ද? එසේ නැතිව මේ සා විශාල ජනකායක් බලෙන් හඬවන්නට පුළුවන්ද? එය අව්‍යාජ සංවේග ප්‍රකාශයක් වූයේ නම් ඒ විදියේ ජනතා අභිවාදනයක් - ළබැඳියාවක් හිමිකර ගන්නට ඒ පුද්ගලයා සමත් වූයේ කෙසේ ද?

දෙවැනි ලෝක මහා සංග්‍රාමයට මුල පුරමින් සමස්ථ ජර්මන් ජාතිය ම සිය ග්‍රහණයට හසු කර ගන්නට සමත් වූ ඇඩොල්ෆ් හිට්ලර් මිය ගිය පසු නැවත කිසි දිනක ඒ විදියට රටක් ජාතියක් මුළා කරගෙන තමාට රිසි පරිදි මෙහෙයවීමට සමත් නායකයකු නොහොත් දුෂ්ටයකු ලොව පහළ නොවනු ඇත යන විශ්වාසයක් ලෝක වාසීන් තුළ හට ගෙන නොතිබුණි ද? තිබුණා නම් ඒ මතය නොහොත් විශ්වාසය උතුරු කොරියානු දර්ශන නිසා බිඳ නොවැටෙන්නේ ද?

ජෝර්ජ් ඕවිල් විසින් රචනා කරන ලද සුප්‍රකට නවකතාව වන 1984 ඔහුගේ මනඃකල්පිතයක් ලෙසින් බැහැර කළ නොහැකි බවට මේ උතුරු කොරියානු විලාප සංදර්ශනය ප්‍රබල සාක්කියක් නොවන්නේ ද? ඔහු ඒ නවකතාව මගින් ඉදිරිපත් කළ චින්තන පොලිසිය බඳු යාන්ත්‍රණ රහිතව අපට පෙන්වන ලද ආකාරයේ ශෝකාලාප ප්‍රදර්ශන ඉදිරිපත් කිරීමට ජනතාවක් පොළඹවා ලිය හැකි ද?

සතිශ්චන්ද්‍ර එදිරිසිංහ විසින් හැටේ දශකයේ වේදිකාවට ගෙන එන ලද -හොටබරි යුද්දෙ" නම් වූ හාස්‍යෝත්පාදක නාට්‍යය ද යට කී ලේඛකයාගේ (ඔර්වල් ගේ) ම නිර්මාණයක් වූ -සත්තු වත්ත" සිංහලට අනුවර්තනය කර ඉදිරිපත් කිරීමකි. සකල සත්වයාගේ ශුභ සිද්ධිය වෙනුවෙන් කැප වුණු නව පාලක පන්තිය සිය බලය තහවුරු කර ගෙන රැකගනුවස් දරන නිරන්තර ව්‍යායාමයත් යොදා ගන්නා විවිධ උපක්‍රමත් එමගින් හාස්‍යයට ලක් කරනු ලැබේ.

ස්ටාලින් යටතේ රුසියාව තුළ උද්ගතවූ මෙබඳු වාතාවරණය සිය රටටත් බලපාන ආකාරය දුටු යුගොස්ලෝවියානු ලේඛක මිනොවන්පිල්ලා ලියූ -නව පන්තිය" නම් කෘතියෙන් එය විවේචනයට ලක් කළේ ය. ඉන්පසු ඒ තත්වයේම වර්ධනය පිළිබිඹු කරන -නව පන්තියෙන් ඔබ්බට" නම් කෘතියක් ද නිර්මාණය කළ ඒ ලේඛකයා කලින් අධිරාජ්‍යවාදී පාලකයන් යටතේ ලැග සිටි සිපිරි ගෙවල්වල නව පන්තිය යටතේ ද ලැග සිටීමේ වරප්‍රසාදය හිමි කර ගත්තේ ය. ඒ මාර්ෂල් ටිටෝ ගේ පාලනය යටතේ ය. මුල දී ටිටෝගේ උපදේශකයාව සිටි ජිල්ලා පසුව ඔහුගේ සිරකාරයෙක් විය.

කොයි තරම් උපහාසයට හා පරිහාසයට ලක් කරනු ලැබුවත් එසේ නිර්මාණය වී තහවුරු වන නව පන්තියට පහසුවෙන් ඉවත් නොවී රැඳී සිටීමේ අද්භූත බල මහිමයක් ඇති බවට දිය හැකි හොඳම නිදසුන උතුරු කොරියානු බෙදවාචකයේ නවතම ජවනිකාව ය.

ලොව පහළ වූ බොහෝ ආගම් මිනිස්කම ගැනත් මිනිසාගේ සමානාත්මතාව ගැනත් කියා ඇත. ක්‍රිස්තුන් වහන්සේ දුක් විඳින ජනතාව වෙනුවෙන් ක්‍රියා කළ සේක. බුදුන් වහන්සේ දුක නැති කිරීමේ මාර්ගය පෙන්වා දුන් සේක. නූතන යුගයේ දේශපාලකයෝත් සමාජ සේවකයෝත් දුක් විඳින ජනතාව සුඛිත මුදිත කිරීමේ පරම චේතනාවෙන් පෙරමුණට එන්නෝ ය. ඒ සියලු දෙනාම මිනිස්කම ගැන මිනිස්කමේ අගය ගැන කතා කරන්නෝ ය. මිනිස්කමට සරිලන පරිදි ඔවුන් ලද යුතු අයිතිවාසිකම් ගැනත් භුක්ති විඳිය යුතු නිදහස ගැනත් කතා කරන්නෝ ය.

ප්‍රජාතන්ත්‍රවාදීහු මිනිස් අයිතිවාසිකම් ගැන කතා කරමින් හැම කෙනකුටම එක් බඳු අවස්ථා තිබිය යුතු බව අවධාරණය කරන්නෝ ය. එබඳු අවස්ථා සැලසිය හැකි වාතාවරණයක් සලසන පාලන රටාවක් ඇති කිරීමට වෙහෙසෙන්නෝ ය. කොමියුනිස්ට්වාදීන් කතා කිරීමෙන් නවතින්නේ නැත . ඒ කියන සමාන තත්වය සමාන අවස්ථා පන්ති සටන් ඔස්සේ ලබා ගන්නා බලය යොදා සහතික කර දීම ඔවුන්ගේ වැඩ සටහනට අයත් වන්නේ ය.

සමාජ පරතරය හා හේතු ඉවත් කරලීම කොමියුනිස්ට්වාදී පාලනයේ මූලික අරමුණ ලෙසින් ගත හැකි ය. එය ඔවුන්ගේ ප්‍රකාශිත ප්‍රතිපත්තිය හැටියට ද ගත හැකි ය. තත්වය අපැහැදිලි වී මුල අමතක වන තැනට කරුණු යෙදෙන්නේ යට කී උසස් ප්‍රතිපත්තිය ප්‍රායෝගික වශයෙන් ක්‍රියාවට නංවන කල්හි ය. මිනොවන් ජිල්ලා විසින් විස්තර කරන ලද නව පන්තිය බිහි වීම අනිවාර්ය වන්නේ ද එසේ ප්‍රායෝගික පක්ෂයට යොමු වුණ විට ය.

කලින් වරප්‍රසාද අහිමිව සිටි දුක් විඳින කොටස් නොහොත් පොදු ජනතාව නව සමාජ රටාවක් තුළ අලුතින් හිමි වූ සැප පහසුකම් භුක්ති විඳින තෘප්තිමත් කොටසක් පත්වන්නේ නැත . මේ නව රටාව යටතේ බිහිවන නව පන්තියට අවනත වී ඔවුන් කියන විදියට හැසිරෙන රූකඩ බවට පොදු ජනතාව පත් වීම හැර කොමියුනිස්ට් පාලනයේ නව පන්තිය යටතේ සිදුවන වෙනත් පෙළහරක් නැත .

අද උතුරු කොරියාවට සිදුවී ඇත්තේ එදා ස්ටාලින් යටතේ රුසියාවට සිදු වූ දේම ය. ස්ටාලින්ට වඩා සවිමත් අයෝමය හස්තයකින් තම රට මේච්චල් කර ගැනීමට කිම් ඉල්සුන් සමත් වූ බව ද කිව හැකි ය. දැන් තුන්වැනි පරපුරටත් මුල පුරා ඇත . අද දවසේ ව්ලැඩිමීර් පුටින් විසින් කවර විදියේ උපක්‍රම යොදනු ලැබුවත් ව්ලැඩිමීර් ලෙනින් ගේ විප්ලවයෙන් උදා කරන ලද විප්ලවයේ නව නිර්මාණය වූ කොමියුනිස්ට් වාදයත් එහි අවශ්‍යාංගයක් වූ පීඩනයත් හමාරය. ඉතිරිව ඇති සුන්බුන් පවා දිගට අල්ලා සිටින්නේ නැත . ඒ වෙනසට මග පෑදීමට තරම් දුර දක්නා නුවණ සහ ආත්ම ශක්තිය ද ඇති නායකයෙක් එහි පහළ විය. ඔහු ඝාතනය කරන්නට ස්ටාලින් කෙනෙක් නොසිටියහ. ඒ නිසා ඒ පුද්ගලයා එනම් ගොර්බචොෆ් අදත් නිරුපXතව ජීවත් වන්නේ ය.

නුදුරු අනාගතයේ උතුරු කොරියාවටත් ඒ වාගේ නායකයකු පහළ වන්නට ඉඩක් ඇද්ද?

මේ සියල්ල කොමියුනිස්ට්වාදීන්ගේ පාලන තන්ත්‍රයක මිනිස් අයිතිවාසිකම්වලට මිනිස්කමට දෙනු ලබන පිළිගැනීම නිදහස නොහොත් ලංසුව පිළිබඳව ය.

ඒ සමගම ප්‍රශ්නයක් නැගිය යුතු වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ මුර දේවතාවුන් හැටියට පෙනී සිටින ලෝක බලවතුන් විසින් මිනිස්කමට දෙනු ලබන ලංසුව කෙබඳුද යන්නය. ලෝක මුස්ලිම් ජනතාවගෙන් සැලකිය යුතු පිරිසක් (හරි වැරදි කෙසේ වුවත්) සියයට තිහක් හතළිහක් වත් වීරයකු වශයෙන් සළකන්නට පුරුදු වී සිටි ඔසාමා බින් ලාඩන් දඩයම් කරනු ලදුව ඔහුගේ සිරුර කිසිවකුට සොයා ගත නොහැකි ආකාරයට අතුරුදන් කරනු ලැබී ය. ලිබියාවේ පමණක් නොව මුලු අරාබිකරයේ ම වීරයා ලෙසින් සම්මානයට පාත්‍රව සිටි මොහෙ-ාමද් ගඩාෆි දඩාවතේ යන බලු කුක්කකු වාගේ වෙඩි තබා මරා දමා අගු පිලක ප්‍රදර්ශනය කිරීම ද ප්‍රජාතන්ත්‍රනායකයන්ට ප්‍රශ්නයක් වූයේ නැත .

ප්‍රශ්නය වනුයේ මේ දෙගොල්ලම තව දුරටත් මිනිස්කමට ගරු කිරීම ගැන මිනිස් අයිතිවාසිකම් ගැන දේසනා කිරීම ය. ■

